# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 6 ශ්‍රේණිය | තාපය හා එහි බලපෑම | ඒකකය - 09 |
|---|---|---|

(01) උෂ්ණත්වය මනින සම්මත ඒකකය කුමක් ද?

1) ෆැරන්හයිට් 2) කෙල්වින් 3) සෙල්සියස් 4) ජූල්

(02) අපගේ ප්‍රධාන තාප ප්‍රභවය වන්නේ,

1) සූර්යයා ය. 2) විදුලිය ය. 3) චන්ද්‍රයා ය. 4) දර ලිප් ය.

(03) මිනිස් සිරුරේ උෂ්ණත්වය කොපමණද?

1) 100 $^0$C 2) 78 $^0$C 3) 43 $^0$C 4) 37$^0$C

(04) වතුර කේතලයක වතුර නටන විට පිටාර ගැලීමට හේතුව වන්නේ,

1) ප්‍රසාරණයයි. 2) සංකෝචනයයි.
3) අවස්ථා විපර්යාසයයි. 4) ඝනීභවනයයි.

(05) අයිස් ජලය බවට පත් වීමේ දී සිදුවන අවස්ථා විපර්යාසය නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද?

1) ද්‍රව ⟶ වායු 2) ඝන ⟶ ද්‍රව
3) ඝන ⟶ වායු 4) ද්‍රව ⟶ ඝන

(06) තාපය යනු,

1) පදාර්ථයකි. 2) ශක්ති විශේෂයකි.
3) අවස්ථා විපර්යාසයකි. 4) පදාර්ථය ශක්තිය බවට පත් වන අවස්ථාවකි.

(07) තාප ප්‍රභව පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1) පෙට්‍රල්, දර, දහයියා 2) දර, L.P වායුව, සබන්
3) ප්ලාස්ටික්, පෙට්‍රල්, වීදුරු 4) කඩදාසි , ජීව වායුව, යකඩ

(08) තාපය උපදවන විදුලි උපකරණයක් නොවන්නේ,

1) රයිස් කුකරය. 2) හීටරය 3) විදුලි උදුනය. 4) විදුලි බුබුළය.

(09) බාහිර පරිසරයේ උෂ්ණත්වය අනුව සිරුරේ උෂ්ණත්වය වෙනස් නොවන සත්ත්වයෙකි.

1) ගෙම්බා 2) නයා 3) මුවා 4) කැරපොත්තා

(10) ස්වයංක්‍රීය තාප පාලකයක් නොමැති විදුලි උපකරණය කුමක්ද?

1) හීටරය 2) විදුලි උදුන 3) රයිස් කුකරය 4) විදුලි ස්ත්‍රික්කය

### B කොටස - රචනා

(01) වරහන තුළ ඇති වචන අතරින් නිවැරදි වචනය තෝරා හිස්තැන් පුරවන්න.

1) අපගේ ප්‍රධාන තාප ප්‍රභවය (සුළඟ / සූර්යයා) වේ.
2) වස්තුවක ඇති උණුසුමේ ප්‍රමාණය .................................. (තාපය/උෂ්ණත්වය)
3) කේතලයේ කෙමියෙන් පිටවෙන්නේ ....................................... (ජලය / ජලවාෂ්ප) ය.
4) ජලයේ තාපය ඉවත්වීම නිසා ....................................... (අයිස්/හුමාලය) සෑදීමට ඉඩ තිබේ.
5) සාගර ජලයේ උෂ්ණත්වය වෙනස්වීම හේතුවෙන් ......................... (දියවැල්/සුනාමි) ඇති වේ.
6) යකඩ තදින් රත් කරන විට පළමුව ..................................... (රතු/සුදු) පැහැයට හැරෙයි.
7) ද්‍රව්‍ය සිසිල් වන විට ..................................... (ප්‍රසාරණය/සංකෝචනය) වේ.
8) (ප්ලාස්ටික්/තඹ පතුර) .................................. තුළින් තාපය හොඳින් ගමන් කරයි.
9) විදුලියෙන් තාපය උපදවන උපකරණයක් වන්නේ .................................
(ගෑස් කුකරය/තාපන දඟරය)
10) උෂ්ණත්වමානය තුළ ඇති ද්‍රව්‍ය රිදී පාටය. මෙම ද්‍රව්‍ය (මද්‍ය සාර/රසදිය) වේ. (ලකුණු 10)

(02) නිවැරදි ප්‍රකාශ ඉදිරියෙන් (√) ලකුණ ද වැරදි ප්‍රකාශය ඉදිරියෙන් (x) ලකුණ ද යොදන්න.

1) ඉන්ධන දහනයෙන් තාපය ලබාගත හැක. ( )
2) ලුණු නිපදවනු ලබන්නේ මුහුදු ජලයෙනි. ( )
3) අවස්ථා විපර්යාසය ඇතිවන්නේ තාපය නිසාය. ( )
4) රසදිය ලෝහය කාමර උෂ්ණත්වයක දී ද්‍රව්‍යයකි. ( )
5) උෂ්ණත්වමානයක රසදිය කඳ උණුසුම වැඩි වන විට පහළ බසී. ( )
6) ජල චක්‍රය ක්‍රියාත්මක වීම කෙරෙහි තාපය බලපායි. ( )
7) සිසිල් දියවැල් ගලා යන්නේ සමකය දෙසටයි. ( )
8) බාහිර පරිසරයේ උෂ්ණත්වය අනුව ගෙම්බාගේ ශරීර උෂ්ණත්වය වෙනස් නොවේ.
9) උෂ්ණත්වය මනින සම්මත ඒකකය වන්නේ කෙල්වින්ය. ( )
10) පෘථිවි උෂ්ණත්වය ඉහළ යන විට ධ්‍රැව ප්‍රදේශවල පවතින අයිස් ජලය බවට පත්වේ. ( ) (ලකුණු 10)

(03) A හා B ගැළපෙන ලෙස යා කරන්න.

| A | B |
|---|---|
| 1) තාප ප්‍රභවය | ඔක්සිජන් වායුව |
| 2) ඉන්ධන | තාපය |
| 3) දහන පෝෂණය | උෂ්ණත්වය |
| 4) තාපය නිසා ඇතිවන විපර්යාස | බන්සන් දාහනය |
| 5) දැල්ලෙන් බීකරයට ලැබෙන ශක්තිය | රසදිය මාවකය මට්ටමේ |
| 6) දැල්ලෙන් ලැබෙන ශක්තියෙන් ජලයෙහි වෙනස්වන ලක්ෂණය | සෙල්සියස් අංශක |
| 7) උෂ්ණත්වය මනින උපකරණය | අවස්ථා විපර්යාසය |
| 8) උෂ්ණත්වය මැනීමේ දී ඇස තැබිය යුත්තේ | 100 $^{0}$C |
| 9) උෂ්ණත්වය මැනීමේ ඒකකය | උෂ්ණත්වමානය |
| 10) නටන ජලයේ උෂ්ණත්වය | මාවකය |

The National e-learning Portal for The General Education

(ලකුණු 10)

(04) (A) පහත සඳහන් අවස්ථා වලදී තාපය උරා ගනීද, තාපය පිටවේ ද යන්න සඳහන් කරන්න.

1) දර දහනය
2) විදුලි බුබුළක් දැල්වෙන විට
3) බටර් දිය වීම
4) ජලය අයිස් බවට පත්වීම
5) උණුසුම් තේ කෝප්පයක් නිවෙන විට (ලකුණු 05)

(B) කෙටි පිළිතුරු සපයන්න.

1) තාපය ප්‍රයෝජනයට ගත හැකි අවස්ථා 02 ක් ලියන්න.
2) රේල් පීලි සවි කිරීමේ දී ඒවා අතර කුඩා හිඩැසක් තැබීමට හේතුව කුමක්ද?
3) ඉඩෝර කාලයේ දී පරිසරයේ දැකිය හැකි වෙනස්කම් 02 ක් ලියන්න. (ලකුණු 05)